**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම-2025**
**පුරවැසි අධ්‍යාපනය**

**විභාග අංකය / නම :**
.................................................................................................................................................

| | | |
|---|---|---|
| **6 ශ්‍රේණිය** | | **කාලය පැය 02** |

## I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.**

- **1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01. පාසලේ ප්‍රධාන පරිපාලන තනතුර වන්නේ,

1. නියෝජ්‍ය විදුහල්පති ය  2. විදුහල්පති ය
3. ජ්‍යෙෂ්ඨ අංශ ප්‍රධානී ය  4. ප්‍රධාන ශිෂ්‍ය නායක ය

02. ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට උපකාරී වන වඩාත් උචිත මූලාශ්‍රයකි.

1. පාසලේ විවිධ ස්ථානවල ඇති සමරුඵලක  2. පාසලේ දැක්ම
3. පාසල් කාලසටහන  4. පාසලේ ගොඩනැගිලි සංඛ්‍යාව

03. රටේ පරිපාලන බෙදීම අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,

1. දිස්ත්‍රික්කයයි  2. පළාතයි
3. ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි  4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි

04. ශ්‍රී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා වන්නේ,

1. සී. ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා  2. ඩී.එස් .සේනානායක මහතා
3. සේනක බිබිලේ මහතා  4. ආතර් වී. දියෙස් මහතා

05. සම්පත් අතරින් ස්වාභාවික සම්පතක් ලෙස හඳුනාගත හැක්කේ,

1. ගොඩනැගිලි  2. මං මාවත්
3. යාන වාහන  4. භූමිය

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර තෝරා තිත් ඉරි මත ලියන්න.**

06. ආවේගශීලීබව හා ............... ඔබේ අභියෝග ජයගැනීමට බාධාවක් වේ.

(අලසබව, නිර්මාණශීලීබව, විද්‍යුත් මාධ්‍ය භාවිතය)

07. පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් නොවන පිරිස වන්නේ ............. යි.

(අනධ්‍යයන කාර්ය මණ්ඩලය, ආදි සිසුන්, ගුරු මණ්ඩලය)

08. ඔබේ දක්ෂතා ................ පෙන්වීම මඟින් ඔබේ දියුණුව සලසා ගත හැකිය.

( නිරන්තරයෙන්, අවශ්‍ය වූ විට, අවස්ථානුකූලව )

09. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාත වන්නේ ............. පළාතයි.

( බස්නාහිර, උතුරු, උතුරු මැද)

10. භෞතික සම්පත් ප්‍රධාන කොටස් ...........කට බෙදේ. ( 2, 3, 5)

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් ( √) ලකුණ ද, වැරදි නම් ( x) ලකුණද වරහන් තුළ යොදන්න.**

11. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුනක් දක්නට ලැබේ. ( )

12. හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟිනි. ( )

13. අතිශය නාගරික සංකීර්ණ පරිසරයක් සහිත බල ප්‍රදේශ තුළ ප්‍රාදේශීය සභාව පිහිටා ඇත. ( )

14. අප ප්‍රයෝජනයට ගන්න බොහෝ සම්පත් සීමිතය. ( )

15. සෑම අභියෝගයක්ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තීන් නොවේ. ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16. මිනිසාගේ .............................. හා කායික හැකියා වැඩිදියුණු කර ගැනීමෙන් මානව සම්පත් බිහිවෙයි.

17. ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක ............... සමන්විතය.

18. පාසල අනාගතයේදී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු ...................තුළින් ප්‍රකාශ වේ.

19. භෞතික සම්පත් මඟින් මිනිසාට ලැබෙන මෙහෙය අතිමහත්ය. එබැවින් ඒවා ................ කළ යුතු ය.

20. ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වූයේ ....................................... මහතා ය.

**(ලකුණු 2 x20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

**01).** i. ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැනගත හැකි මූලාශ්‍ර දෙකක් ලියන්න.
ii. සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසි දෙකක් ලියන්න.
iii. පාසල් සංස්කෘතියට අයත් අංග දෙකක් නම් කරන්න.
iv. ඔබ ජීවත්වන ප්‍රදේශය අයත් පළාත හා දිස්ත්‍රික්කය නම් කරන්න.
v. ඔබ ප්‍රදේශයේ ජනතාව තම අවශ්‍යතා ඉටුකර ගැනීමට පිහිටුවාගත් සමිති දෙකක් නම් කරන්න.
vi. සමාජයෙන් පාසලට සිදුවන සේවා දෙකක් ලියන්න.
vii. භූමියෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
viii. පාසලේ අනන්‍යතාව පිළිඹිබු කරන සංකේත දෙකක් ලියන්න. (ලකුණු 2 x8 = 16)

**02).** i. පාසලේ පවතින පොදු නීති රීති දෙකක් ලියන්න. (ල. 02)
ii. පාසලෙන් සමාජයට සැලසෙන සේවාවන් හතරක් ලියන්න. (ල. 04)
iii. පාසල් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට හා ඔබේ හැකියා වර්ධනය කරගැනීමට රජය විසින් සපයා ඇති පහසුකම් පහක් ලියන්න. (ල. 05)

**03).** i. ඔබ සතුව ඔබට ඇතැයි සිතෙන දුර්වලතා දෙකක් ලියන්න. (ල. 02)
ii. ඔබ සතු දක්ෂතා හතරක් ලින්න. (ල. 04)
iii. පුද්ගලයෙකු සතු හැකියා, දක්ෂතා වැඩිදියුණු කරගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේද පහක් ලියන්න. (ල. 05)

**04).** i. ස්වාභාවික නොවන භෞතික සම්පත් දෙකක් නම් කරන්න. (ල. 02)
ii.භෞතික සම්පතක් වන ජලයෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 04)
iii. භෞතික සම්පත් සංරක්ෂණයට ගතහැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ල. 05)

**05).** i. ජීව දත්ත පත්‍රිකාවක තිබිය යුතු අනිවාර්ය තොරතුරු දෙකක් ලියන්න. (ල. 02)
ii. පාසල් ශිෂ්‍යයෙකු ලෙස තම ඉලක්ක ජය ගැනිමට මෙන්ම සංවර්ධනය කරගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල. 04)
iii. සැලසුම් සහගත ශිෂ්‍යයෙකුගේ ගති ලක්ෂණ පහක් ලියන්න. (ල. 05)

**06).** i. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)
ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටුවන සේවාවන් හතරක් ලියන්න. (ල. 04)
iii. ආගමික සිද්ධස්ථාන මඟින් සිදුවන සේවා පහක් ලියන්න. (ල. 05)

**07).** i. ඔබ අසල්වාසීන් හා ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකව කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න (ල. 02)

ii. ඔබ ප්‍රදේශයේ සිටින මානව සම්පත් හතරක් නම් කරන්න. (ල. 04)

iii. සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ල. 05)